**ශීර්ෂය - 001 අතිගරු ජනාධිපති කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 001 අතිගරු ජනාධිපති 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති වැය ශීර්ෂයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ඔක්තෝබර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව<br><br>ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 315, 880 හා 881 | අනුකූල නොවීම<br><br>ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු කිසිදු නිලධාරියකු විසින් ඇප තැන්පත් කිරීම සිදු කර නොතිබුණි. | රාජ්‍ය නිලධාරින්ගේ ඇප තැබීම සම්බන්ධ කටයුතු රජයේ ඇපකාරක සංගමය හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මඟින් සිදු කිරීමට අපේක්ෂිත අතර, රාජ්‍ය නිලධාරීන් ඇප තැබීම සම්බන්ධයෙන් පවතින මාර්ගෝපදේශ අනුව නිලධාරීන්ගේ තනතුරු අනුව තැබිය යුතු ඇප වටිනාකම් පිළිබඳව නිශ්චිත සඳහනක් නොමැති වීම නිසා නිලධාරීන්ගේ වගකීම්, අවදානම් ආදි කරුණු සැලැකිල්ලට ගෙන ඇප තීරණය කළ යුතුව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ආ) | චක්‍රලේඛ කළමනාකරණ අංක 04/2018 හා 2018 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයේ 1:3:1 ඡේදය හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ අංක PS/IAD/TR/Q/ Insurance/2024/ 25 හා 2023 ඔක්තෝබර් මස 21 දිනැති ලිපිය | සියළුම වාහන සඳහා වර්ෂ 05 කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්යය වුවද ජනාධිපති කාර්යාලයේ වාහන සමාලෝචිත වර්ෂය තුලදී චක්‍රලේඛ උපදෙස් පරිදි තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. | වාහනවල වර්තමාන වටිනාකම තක්සේරු කිරීමට කමිටුවක් පත් කර ඇතත් ජනාධිපති කාර්යාලය සතුව රථවාහන 600කට ආසන්න ප්‍රමාණයක් රටපුරා විසිර රාජකාරීන්හි යොදවා ඇති බැවින් තනි කමිටුවක් මඟින් සිදු කිරීම ගැටළු සහගත බැවින් තක්සේරු ක්‍රියාවලිය නිවැරදිව ඉටු කර ගැනීමට අනු කමිටු පත් කර දෙන ලෙස යෝජනා කර ඇත. මේ සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත්කර ඇති අතර, තක්සේරු කමිටු වාර්තා ලද වහාම වර්තමාන වටිනාකම් කඩිනමින් ලබා දීමට කටයුතු කළ හැක. | එම |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් තුනක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව රු.3,000,000 කින් වර්ෂය තුල කිසිදු වියදමක් නොදරා ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | හිටපු ජනාධිපතිවරුන්ට ගොඩනැගිලි හා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මෙම ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත්, 2023 වර්ෂයේදී හිටපු ජනාධිපතිවරුන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබූ හෙයින් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී ඇත. | අවශ්‍යතාවයන් හඳුනාගෙන වාර්ෂික සැලසුම් හා ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. |
| (ආ) | වැය විෂයයන් දෙකක එකතුව රු.3,500,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. | අපේක්ෂිත පරිදි වියදම් ජනනය නොවීම නිසා හා ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව අවසන් කිරීම හේතුවෙන් අපේක්ෂා කල පරිදි වියදම් ජනනය නොවීම නිසා අතිරික්ත ප්‍රතිපාදන ඌන වැය විෂයන් වෙත මාරු කරන ලදි. | එම |
| (ඇ) | වැය විෂයයන් 15 ක් සඳහා ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා මුල් ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 456 ක පරාසයකින් මුදල් රෙගුලාසි 66 මඟින් එකතුව රු.223,855,000 කින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා නිලධාරීන් යෙදවීම, නඩත්තු මිල ගණන් ඉහල යාම, ගොඩනැගිලිවල අත්‍යාවශ්‍යම නඩත්තු කටයුතු සිදු කල යුතු වීම, අපේක්ෂිත ප්‍රමාණයට වඩා මාණ්ඩලික නිලධාරීන් ප්‍රවාහන දීමනා ඉල්ලුම් කිරීම, වාහන අමතර කොටස් මිල ඉහලයාම, නව අංශ ස්ථාපිත කිරීම, විදේශ පුහුණු සඳහා නිලධාරීන් යොමු කිරීම, ලිපිද්‍රව්‍ය වියදම් ඉහලයාම, නව කොමිෂන් සභා ස්ථාපිත කිරීම, ඉන්ධන කූපන්පත් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අතිරික්ත වැය විෂයකින් මාරු කර ගැනීමට සිදුවීම සහ අවශ්‍ය පහසුකම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අතිරික්ත වැය විෂයකින් මාරු කර ගන්නා ලදි. | එම |
| (ඈ) | වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මු.රෙ. 66 හා පරිපූරක ඇස්තමේන්තු මඟින් එකතුව රු.801,500,000 ක ප්‍රතිපාදන සලසාගෙන සියයට 49 සිට සියයට 3648 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. | අපේක්ෂිත විදේශ සංචාරයන්ට වඩා රාජතාන්ත්‍රික මට්ටමින් සමුළු, සම්මන්ත්‍රණ වලට ආරාධනා ලැබීම, ඉන්ධන මිල ඉහළ යාම, විදුලි හා ජල බිල්පත් ඉහළ යාම, පූර්ව වර්ෂවල හිඟ ගෙවල් කුලී නිරවුල් කිරීම ආදිය හේතුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් අතිරික්ත වැය විෂයන්ගෙන් හා පරිපූරක ඇස්තමේන්තු මඟින් සපයා ගන්නා ලදි. | එම |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොමැති ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සඳහා රු.43,400,000 ක් ද ලෝක ආහාර සහනාධාර වැඩසටහන සඳහා රු.3,868,600,000 ක් ද පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට 2023 වර්ෂයට අයවැය ප්‍රතිපාදන නොතිබුනු බැවින්, 2024 වර්ෂයට නව වැය ශීර්ෂයක් හඳුන්වා දෙන තෙක් අතිගරු ජනාධිපති වැය ශීර්ෂය තුළින් රු. මිලියන 43.4ක අතිරේක ප්‍රතිපාදනයක් බලපත්‍ර අංක 355 යටතේ ලබා දී ඇත.<br>2023-2027 කාලපරිච්ඡේදය සඳහා (CSP 2023-2027) ලෝක ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ජනාධිපති කාර්යාලය යටතට ගැනුනු බැවින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ සළසා තිබූ ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ජනාධිපති කාර්යාලයට මාරු කිරීම 2023.01.10 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර අංක 01 යටතේ සිදුකරන ලදි. 2022-2023 වර්ෂයන් තුළ ඇති වූ ආර්ථික අර්බුදකාරී තත්ත්වයට හදිසි ප්‍රතිචාර දැක්වීමක් ලෙස, ලෝක ආහාර වැඩසටහන විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලද රුපියල් 2,068,600,000ක ද්‍රව්‍යමය ආහාර තොගයේ වටිනාකම රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 අනුව ගිණුම්ගත කිරීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් බලපත්‍ර අංක 361 යටතේ 2023.10.25 දින සපයා ගැනීමට කටයුතු කෙරුණි. | එම |
| (ඊ) | පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසාගත් වැය විෂයයන් අටකට අදාලව රු.253,481,202 ක් වියදම් නොකර ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය සියයට 12 සිට සියයට 90 අතර පරාසයක පැවතුණි. | අයවැය චක්‍රලේඛ අනුව, දේශීය ගමන් වියදම් දැඩි පාලනයක් සිදු කිරීම, ප්‍රවාහනය කාර්යයන්ට අඩු වියදම් ක්‍රම භාවිතා කිරීම, දෙසැම්බර් මාසයේ ජල හා විදුලි බිල්පත් වටිනාකම මෙම ඉතිරිවීම තුල ඇති බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් මුද්‍රණය අඩු වියදමකින් සිදු කර ගැනීමත්, නිලධාරීන් දෙදෙනෙකු සඳහා පමණක් දේපල ණය මත පොලී ගෙවීමත් ලාභදායී මිල ගණන් මත ලිබ්ඩු හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම, පුහුණු වැඩසටහන් අඩු වියදමින් පැවැත්වීම, ලෝක ආහාර වැඩසටහනට රජයේ දායකත්වය සැපයීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර ප්‍රතිපාදන ඉතිරිවීම සඳහා එම හේතුන් බලපා ඇත. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යයන් ඉටු නොවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන වැඩසටහන් සඳහා ආයතන 12 කට ලබාදී තිබූ රු.348,654,373ක ප්‍රතිපාදන වලින් රු.239,275,587 ක් පමණක් වියදම් දරා තිබුණි. ඒ අනුව ආයතන අටක් විසින් වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 31 හෙවත් රු.109,378,786 ක් උපයෝජනය කර නොතිබුණි. | ජනාධිපති කාර්යලය වෙත ඉදිරිපත් වන සංවර්ධන ව්‍යාපෘතීන් අතරින් ප්‍රමුඛතාවය මත තෝරා ගන්නා ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රතිපාදන පැවරීමක් සිදු කර ඇත.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය සහ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදුන් ප්‍රතිපාදන හැර අනිකුත් ආයතන වෙත නිදහස් කර ඇති ප්‍රතිපාදන ඉතා කාර්යක්ෂමව උපයෝජනය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සංවර්ධන වැඩසටහන් තෝරා ගැනීමේදී අත්‍යාවශ්‍ය හා ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතීන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සංවර්ධන වැඩසටහන් දෙකක් සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 40 ක් හා 76 ක් වියදම් නොකර ඉතිරිවී තිබූ අතර ලබාදුන් ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය වන බව තහවුරු කර ගැනීමට හා භාවිතා නොකරන එම මුදල් වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා හෝ යොමු කරවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉල්ලීමට පොතුවිල් උප ඩිපෝව ප්‍රධාන ඩිපෝවක් බවට උත්ශ්‍රේණිගත කිරීමට රු.මිලියන 60 ක ප්‍රතිපාදන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී එම සංවර්ධන ව්‍යාපෘතිය කාර්යක්ෂමව සිදු කර බිල්පත් පියවීමට අවශ්‍ය අක්මුදල් සපයා ගැනිමෙ පූර්ණ වගකීම ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සතුවේ.<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉදිකිරීම් සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබාදී මෙම ඉදිකිරීම් සිදු කිරීම හා අදාල බිල්පත් නිරවුල් කිරීම සඳහා අක් මුදල් සපයා ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යයක් වන අතර ජනාධිපති කාර්යාලයේ පාලනයෙන් පරිබාහිර කටයුත්තක් බව කරුණාවෙන් දන්වා සිටිමි. | සංවර්ධන කටයුතු සඳහා වන වාර්ෂික ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීම පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතු වීම. |

### 3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාමික ජනාධිපතිවරයකු සඳහා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් වැය විෂයය ට රු.1,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද කිසිදු වියදමක් නොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර මූල්‍ය ප්‍රකාශණ වල | මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති බව කාරුණිකව දන්වමි.<br>නමුත්, විශ්‍රාමික ජනාධිපතිතුමා වෙත පහසුකම් සැපයීම සම්බන්ධයෙන් අවශ්‍යතාවය මත පැන නැගුනු අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කිහිපයක් සිදු කර ගැනීමට | ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | ඉතිරිවීම් සඳහා හේතු වශයෙන් අපේක්ෂිත පරිදි වියදම් පැන නොනැගිනි බව දක්වා තිබූ නමුත් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැයවිෂයයෙන් එම හිටපු ජනාධිපතිගේ නිල නිවාස අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට රු.18,336,135 ක ප්‍රතිපාදන ද නිල නිවාසයේ එක්ස්කැලේටරයක් සවි කිරීමට රු.15,093,876 ක් හා ජෙනරේටරයක් මිලට ගැනීමට රු.4,885,844 ක් බිල්පත් මඟින් ද ගෙවීම් කර තිබුණි. මෙම වියදම් සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ මුළු වියදමින් සියයට 10 ක් වී තිබූ අතර වාර්ෂික අයවැය ප්‍රතිපාදන වලින් එම ජනාධිපතිවරයා සඳහා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට සලසා තිබූ ප්‍රතිපාදනය සමඟ සැසඳීමේදී එම ප්‍රතිපාදනය ඉක්මවා රු.37,315,855 ක් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය ශීර්ෂයෙන් දරා ඇති බව නිරීක්ෂණය විය. | වැය ශීර්ෂ 001-1-03-5-2001 යටතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය වැය විෂය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ප්‍රතිපාදන ලබා දීම සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එක්ස්කැලේටරය හා ජෙනරේටරය මිලදී ගැනීම සඳහා වැය කල රු.19,979,720 ක මුදල නව මූලධන වත්කම් අත්පත් කර ගැනීමකි. එම අවස්ථාවේ 001-01-01-0-2103 වැය විෂයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබූ බැවින් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය විෂය යටතේ වැය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වීම. |
| (ආ) | සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය විෂය ප්‍රතිපාදන වලින් රු.45,710,216 ක් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පාසල් තුනක ගොඩනැගිලි නවීකරණය සහ ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබුණ ද පාසල් තෝරාගැනීමේ නිර්නායක අනාවරණය නොවුණි. | කොළඹ ආනන්ද විද්‍යාලය, විශාඛා විද්‍යාලය හා රාජකීය විද්‍යාලය යන පාසල් විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් සලකා එම පාසල්වල යහ පැවැත්ම උදෙසා ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කිහිපයක් සිදු කිරීම උදෙසා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>මෙම පාසල්වල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා පමණක් නොව පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් කිහිපයක අඩක් නිම කළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ද අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන ලබා දීමක් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සංවර්ධන ව්‍යාපෘති තෝරාගැනීමේදී අවශ්‍යතාවයන් පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතු වීම. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කර ඇති වාහන 07 ක හා 2022 හා 2023 වර්ෂවලදී අපහරණය සඳහා නිර්දේශ කර තිබූ වාහන 06ක අපහරණ කටයුතු මේ වනවිටත් නිමකිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කමිටුව වෙතින් මේ වන විට තක්සේරු වටිනාකම ඇතුළත් රහස්‍ය වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව ද ඉදිරියේදී මෙම වාහන 07 වෙන්දේසි කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට ද නඩු කටයුතු පවතින වාහන 3 සහ අසාදු ලේඛනගත කර ඇති වාහනය හැරුණු කොට අනෙකුත් වාහන සම්බන්ධ අදාළ අපහරණ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින අතර, අදාළ වාහන අපහරණය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් වෙන්දේසි කිරීම හා අපහරණය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුවීම. |